**රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල - 2014**

**-----------------------------------------------**

රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන්

වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 2.2.1 ගිණුම් ප්‍රතිපත්ති

-----------------

රේගු ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන "සියයට 2.5 ක් ත්‍යාග අරමුදල" නමින් වූ අරමුදලින් සමාලෝචිත වර්ෂය තුල රු.28,656,305 ක් වැයකර තිබුණද එම අරමුදලින් දැරිය හැකි වියදම් පිළිබඳව නිශ්චිත නිර්ණායකයන් ගිණුම් ප්‍රතිපත්ති තුළින් අනාවරණය නොවීය.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ත්‍යාග අරමුදලේ වියදම් ලෙස ගිණුම්ගත වී ඇති නමුත් මුදලින් ගෙවා නොතිබූ එකතුව රු.569,279,165 ක් වූ නොගෙවූ ත්‍යාග මුදල් වගකීමක් ලෙස අනාවරණය නොකර භාණ්ඩාගාර තැන්පතු ගිණුමට ගලපා ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ආ) එකතුව රු.5,282,713 ක් වූ නොගෙවූ ත්‍යාග ලැයිස්තු 03 ක වටිනාකම දෙවරක් ගිණුම්ගත වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල වියදම් හා වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 ගෙවිය යුතු ගිණුම්

---------------------

නිලධාරීන් විසින් ලබා නොගත් එකතුව රු.26,429,947 ක් වූ ත්‍යාග මුදල්, ආපසු ගෙවීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීම වෙනුවට වර්ෂ ගණනාවක සිට "ආපසු තැන්පත් ත්‍යාග ගිණුම" (Reward Retuned Deposit Account) නමින් වූ ගිණුමකට බැර කර ශේෂය ඉදිරියට ගෙන එමින් පැවතුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.36,526,769 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.115,741,700 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.79,214,931 කින් හෙවත් සියයට 68.44 කින් අඩුවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු.72,682,856 කින් හෙවත් සියයට 5.17 කින් අඩුවී තිබුණද මුළු ආදායම ද රු.151,897,787 කින් හෙවත් සියයට 9.98 කින් අඩුවීම මෙම අතිරික්තය අඩුවීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ තුනකට අදාලව අරමුදලේ ආදායම්, වියදම් හා ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු පහත දක්වා ඇත.

| වර්ෂය | ආදායම | වියදම | | | | මුළු වියදම | අතිරික්තය |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | | නිලධාරීන්ට ගෙවීම් | ඔත්තුකරුවන්ට ගෙවීම් | බදු, දේශීය ආදායම් දෙපා: | අනෙකුත් වියදම් | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2011 | 873,979,003 | 574,047,509 | 106,080,370 | 33,927,845 | 102,229,782 | 816,285,506 | 57,693,497 |
| 2012 | 973,210,594 | 694,361,096 | 128,208,276 | 42,779,776 | 60,262,398 | 925,611,546 | 47,599,048 |
| 2013 | 1,522,699,798 | 1,146,769,044 | 121,281,124 | 64,157,056 | 74,750,874 | 1,406,958,098 | 115,741,700 |
| 2014 | 1,370,802,011 | 1,025,591,909 | 117,310,035 | 126,095,842 | 65,277,456 | 1,334,275,242 | 36,526,769 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ නිලධාරීන්ට ත්‍යාග ගෙවීම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.121,177,135 කින් හෙවත් සියයට 10.57 ක් අඩු වී තිබුණි.

(ආ) 2011,2012, 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු. මිලියන 680 ක්,රු. මිලියන 822 ක්, රු. මිලියන 1,268 ක් හා රු. මිලියන 1,143 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,913 ක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණි. එයින් රු. මිලියන 3,441 ක් හෙවත් සියයට 87.94 ක් නිලධාරීන්ට ත්‍යාග ලෙස ගෙවා තිබුණි. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 හා 2014 වර්ෂවල ත්‍යාග අරමුදලේ ආදායම පිළිවෙලින් සියයට 56 කින් හා සියයට 41 කින් වැඩි වී තිබූ අතර නිලධාරීන්ට ගෙවා ඇති මුදල්ද පිළිවෙලින් සියයට 65 කින් හා සියයට 48 කින් වර්ධනය වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායමින් හා විවිධ රේගු වැරදි සඳහා පනවන ලද දණ්ඩන මුදල්වලින් විශාල මුදලක් මෙසේ ත්‍යාග මුදල් ලෙස ගෙවා තිබුණද එම ආදායමින් රජයේ ආදායමට බැර වන්නේ සියයට 30 ක් පමණක් බව නිරීක්ෂණය විය.

### 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

රේගු දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ සමාලෝචිත වර්ෂයේ ඉන්ධන වියදම් සඳහා ඒකාබද්ධ අරමුදලෙන් රු.40,000,000 ක ප්‍රතිපාදනය ලබාදී තිබියදී ඊට අමතරව ත්‍යාග අරමුදලින් ද රු.36,845,912 ක මුදලක් ඉන්ධන සඳහා වැය කර තිබුණි.

### 4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉල්ලුම් නොකල ත්‍යාග ගිණුම් සම්බන්ධ තොරතුරු ආපසු තැන්පත් ලෙජරයේ වාර්තා කිරීමේදී වෙනස් අංකයන් යටතේ වාර්තා කිරීම්, ගෙවීම් දිනය සටහන් නොකිරීම්, මාණ්ඩලික නිලධාරියෙකු අත්සන් නොකල අවස්ථා පැවතීම්, පිටු අංක සඳහන් නොකිරීම් හා ලේඛනයේ පිටු ඉවත් කර තිබූ අවස්ථාවන් පැවතීම වැනි දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(ආ) 2014 ජනවාරි 01 දිනට පැවති නොගෙවූ ත්‍යාග ලැයිස්තු සඳහා ගෙවීම් සම්පූර්ණ කිරීමට පෙර 2014 වර්ෂයට අදාල ත්‍යාග ලැයිස්තු සඳහා ගෙවීම් කිරීම් හේතුවෙන් එකතුව රු.34,690,513 ක්වූ පෙර වසරේ ඉදිරිපත් කළ ත්‍යාග ලැයිස්තු 15 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවීම් කර නොතිබුණි. ඒ අනුව අරමුදලේ

ගෙවීම් කිරීමට නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ, 4.3 ප්‍රකාරව අරමුදල්වල වාර්ෂික කාර්යසාධන වාර්තා හා මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2015 ජූලි 07 දින හෙවත් මාස 04 කට ආසන්න කාල ප්‍රමාදයකින් පසුවය.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික අයවැය ලේඛනය ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 දිනට පෙර අනුමත කර ගත යුතු වුවද එසේ කර නොතිබුණි.

(ආ) වියදම් අයිතම 07 ක් සම්බන්ධව අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 36 සිට සියයට 100 දක්වා විචලනයන් පැවතුන අතර ආදායම් අයිතම 2 ක් සම්බන්ධයෙන් අයවැයගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 29 සිට සියයට 70 ක් දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අරමුදල් පාලනය